# ලංකාණ්ඩුවේ "ගැසට්" පත්‍රය.

ආණ්ඩුවේ අවසරයපිට ප්‍රසිද්ධකරණලදී.

නො. 6,960 — 1918ක්වූ අගෝස්තු මස 9වෙනි දිනවූ සිකුරාදා.


## Part IV.—හතරවෙනි කාණ්ඩය.

---

### ආණ්ඩුකාර උතුමාණන්වහන්සේ විසින් දෙවාවදාරණලද ප්‍රකාශපත්‍රයකි.

මහාබ්‍රිතාන්‍යය සහ අයර්ලන්තය යන එක්සත් රාජ්‍යයේද, මුහුදින් එතර රාජ්‍යවලද, රජවූ සමයසංරක්‍ෂක පස්වෙනි ජෝර්ජ් නාමෝපලක්‍ෂිත මහරජෝත්තමයාණන්වහන්සේගේ නාමයෙන්ය:

ශාන්ත ජෝර්ජ් සහ ශාන්ත මයිකල් යන අතිවිශිෂ්ට පඞ්ක්තියේ සාමාජික ධූරන්ධර යටත් ප්‍රදේශ
ඇතුළුවූ ලංකාවීපයේ වැඩබලන ආණ්ඩුකාර රෙජිනෝල්ඩ් ඇඩ්වර්ඩ් ස්ටබ්ස්
උතුමාණන්වහන්සේ විසින් දෙවාවදාළ

**ප්‍ර කා ශ ප ත්‍ර ය කි.**

ආර්. ඊ. ස්ටබ්ස්.

ගම්බද පාඨශාලා සම්බන්ධ 1907තේ නොම්මර 8වේ ආඥාපනතේ 19වෙනි සහ 20වෙනි වගන්තිවලින් පවරා තිබෙන බලය කරණකොටගෙන පුත්තලමේ දිස්ත්‍රික් පාඨශාලා කාරකසභාව විසින් සාදනලද අතුරුපනත් (එකී ආඥාපනතේ 20 වෙනි වගන්තියේ 2වෙනි උපවගන්තියෙන් පවරාතිබෙන බලයපිට) කාරක මන්ත්‍රණසභාවේ මන්ත්‍රණය ඇතුව ආණ්ඩුකාර උතුමාණන්වහන්සේ විසින් ස්ථිරකරණලැබ 1909යේ අගෝස්තු මස 5වෙනි දින දරණ ප්‍රකාශපත්‍රයේ මාර්ගයෙන් 1909යේ අගෝස්තු මස 13වෙනි දින නොම්මර 6,323 දරණ ගැසට් පත්‍රයෙහි ප්‍රසිද්ධ කරණලදී.

තවද ඉහතකී දිස්ත්‍රික් පාඨශාලා කාරකසභාව විසින් ඉහතකී අතුරුපනත් අතුරෙන් දෙවෙනි අතුරුපනත වනී 1917තේ 34වෙනි ආඥාපනතෙන් ප්‍රතිසංස්කරණය කළාවූ 20 (1) (*b*) යන වගන්තියේ ප්‍රකාර ප්‍රතිසංස්කරණය කරන්වද එම ආඥාපනතෙන් ප්‍රතිසංස්කරණයකළාවූ ලෙස 20 (1) (*a*) යන වගන්තියේ ප්‍රකාර නොම්මර 7 වශයෙන් සංඛ්‍යාකරණු ලබන අතුරුපනතක්ද ඉහතකී අතුරුපනත්වලට එකතුකරන්ට යෙදුනා ඇත.

තවද වැඩබලන ආණ්ඩුකාරයාණන්වූ අපකෙරෙහි ඉහතකී ආඥාපනතේ 20 (2) වෙනි වගන්තියෙන් පවරණලද බලය පිටද කාරක මන්ත්‍රණ සභාවේ මන්ත්‍රණය ඇතුවද මෙහි හැඩුල්පත්‍රයේ දක්වා තිබෙන ප්‍රකාර ඉහතකී දෙවෙනි අතුරුපනතේ ප්‍රතිසංස්කරණය සහ අමුතුවෙන් එකතුකරණලද නොම්බර 7 මෙන් සංඛ්‍යාකරණ අතුරුපනතත් අප විසින් මෙයින් ස්ථිර කරණබව සියළුදෙනා දැනගත යුතුයි.

අප ස්වාමින්වහන්සේගේ වර්ෂයෙන් එක්දහස් නවසිය දහඅටක්වූ අගෝස්තු මස තුන්වෙනි දින මෙම ලංකාවීපයේ කොළඹදී දෙවාවදාළා ඇත.

ආණ්ඩුකාර උතුමාණන්වහන්සේගේ අණපරිද්දෙන්,

ඒ. ඇස්. පැග්ඩන්,
වැඩබලන මහසෙක්‍රතාරිස් වම්හ.

**රජතුමාණන් දෙවියෝ රකිත්වා.**

---

හැඩුල්පත්‍රයකි.

1. දෙවෙනි අතුරුපනතේ පළමුවෙනි පේළියේ "දොළහ" කියන වචනය වෙනුවට "දහහතර" කියන වචනය යෙදිය යුතුයි.

2. මෙහි පහත සඳහන්වූ උපනියමය දෙවෙනි අතුරුපනතට එක්කාසුකළ යුතුයි:—

ගොවිතැන් කාලයේ හෝ වෙන කොයියම් සැලකියයුතු කාරණවක් සඳහා හෝ වයස දොළහෙන් ඉහළ පිරිමි ළමයින් පාඨශාලාවට නොපැමිනීම සඳහා කාලික වශයෙන් නිදහසක් දීමට කොමිටියේ ප්‍රධානතැනට බලය තිබේ.

3. දෙවෙනි අනුරූපණයේ 4වෙනි සහ 5වෙනි පේළිවල "බී අක්ෂරය හෝ සී අක්ෂරය දරණ හැඩුල්පත්‍රය" කියන වචනවලට පසුව "ළමයෙක් පදිංචි ස්ථානයේ සිට හැතැප්ම තුනකට වැඩිනොවන වෙන දිස්ත්‍රික්කයක කොයියම් පාඨශාලාවකට හෝ" යන වගන්තිය එක්කාසුකළ යුතුයි.

4. මෙහි පහත සඳහන්වන අනුරූපණය එක්කාසුකොට නොම්මර 7වෙනි අනුරූපණය මෙන් සංඛ්‍යා කටයුතුයි.

7. යම් පාඨශාලා කාමරයක හෝ උගැන්වීමට ඉහතින් පාවිච්චි නොකරනලද ගොඩනැගිල්ලක හෝ පාඨශාලාවට යායුතු වයසැති ළමයින් පැමිණෙන පඩක්තියකට හෝ පඩක්තිවලට ඉංග්‍රීසි භාෂාව හෝ වෙනයම් භාෂාවක් ඉගැන්වීමට කැමති කිසිවෙකු විසින් හෝ පාඨශාලාවක් විවෘත කිරීමට කැමති කිසිවෙකු විසින් හෝ එබඳු පාඨශාලා කමිටාන හෝ ඉගැන්වීම පටන්ගන්ට ඉතාම අඩුවශයෙන් මාසයකට පෙර ඒ බව ඉතාමත් කිට්ටුව සිටින අධ්‍යාපන පරීක්ෂකතැනට හෝ උප පරීක්ෂකතැනට දැන්විය යුතුයි. ඒට පසු ඔහුගේ පඩක්තිය හෝ පඩක්ති සම්බන්ධවද ඔහු විසින් එහි ඉගැන්වීමට යෝජනා කරණ ක්‍රම සම්බන්ධවද ඉගැන්වීමේ අධ්‍යක්ෂකතුමා විසින් උවමනාකරණ ඒ ඒ තොරතුරු දැන්විය යුතුයි.. ඉහතකී ප්‍රති සංස්කරණ සහ එක්කිරීම් වෂී 1918ක්වූ ජනවාරි මස 31වෙනි දින පවත්වන්ට යෙදුන පුත්තලම් දිස්ත්‍රික්කයේ පාඨශාලා කාරක සභාවේ සභාරැස්වීමකදී කරන්ට යෙදුනා ඇත.

ඩබ්ලිව්. ඒ. වෙච්,
පුත්තලමේ දිස්ත්‍රික් පාඨශාලා කාරක සභාවේ ප්‍රධානතැන.

---

## ඉඩම් විකිණීම්.

No. 3,159, S. P.—අදාළ දිසාවේ ඒජන්ත උන්නාන්සේ විසින් මෙහි පහත සඳහන්වෙන ආණ්ඩුව සන්තක ඉඩම් ආණ්ඩුවේ නියෝග වල ප්‍රකාරයට වෂී 1918ක්වූ සැප්තැම්බර් මස 17වෙනි දිනවූ අඟහරුවාදා පස්වරු 1ට ගාල්ලේ කච්චේරියේදී වෙන්දේසිකර විකුණන්ට හෝ බේරුම්කරදෙන්ට නොහොත් වෙන අන්දමකින් තීන්දුකරන්ට යෙදෙනවා ඇත. අදාළ දිසාවේ ගාළු පලාතේ ගහබඩපත්තුවේ කොට්ඨාසයේ පිහිටාතිබෙන බිම්කැබලි 16ක්.

| අංක. | ඉඩමේ නම. | අයිතිකරුවන්නා. | වගාව. | මහත, අ. රූ. ප. | අක්කරයක මිල, රු. |
|---|---|---|---|---|---|
| | සිතියම 9,710. ගම—වදුරඹ. ඉල්ලුම්කාරයා—වදුරඹ පදිංචි වත්තේගේ තොරොන්තිස්. | | | | |
| 3219 | දෙලඹුල්ලේගොඩ | රජසන්තක | බැද්ද | 1 0 0 | 80 |
| | සිතියම 9,822. ගම—පානවැලිවිටිය. මෙම ඉඩමට ඉල්ලුම්කාරයෙක් නැහැ. | | | | |
| 3613 | කිඹුලාගිවියකුඹුරේදූව | රජසන්තක | හේන | 0 0 32 | 30 |
| | සිතියම 9,953. ඉල්ලුම්කාරයා—මාකාවිටගමගේ ජොහානිස්. | | | | |
| 4039 | එලලබවිලකරතුර | ඇල්. බී. ගුරුසිංහ | කුරුඳු<br>වැවිල්ල | 0 0 35 | 35<br>1 |
| | සිතියම 10,816. ගම—උඌරල මෙම ඉඩම්වලට ඉල්ලුම්කාරයෙක් නැහැ. | | | | |
| 1 | තුඩෙගේන | බද්දේගම පී. ඒ. අබේවික්‍රම | රබර්<br>වැවිල්ල | 0 0 30 | 95<br>18 |
| 4 | මිදෙල්ලගස් කැටිය කුඹුරේ අද්දර | මාබොටුවන පදිංචි ඩබ්ලිව්. චාර්ලිස් ද සිල්වා | රබර්<br>වැවිල්ල | 0 0 37 | 95<br>23·25 |
| 5 | අළුත්කුඹුරේඅද්දරදෙනිය | මහගමගේ සිංඤෝ අප්පු | එලවළු සිටවාපු<br>වැවිල්ල<br>මැටි ගේ | 0 2 0 | 95<br>2·40<br>2 |
| | සිතියම 10,828. ගම—ඇත්කඳුර. ඉල්ලුම්කාරයා—ඇත්කඳුරේ පදිංචි හෙම්බුකුට්ටිගේ පුංචිහාමි. | | | | |
| 1 | පිඹුරකනත්තේකැලේ | රජසන්තක | පුළුබැද්ද | 0 3 37·1 | 55* |
| 2 | එම | එම | පුළු බැද්ද (විකුනන්නේ නැහැ) | 0 0 3·7 | —† |
| | සිතියම 10,832. ගම—බද්දේගම නැගෙණහිර. ඉල්ලුම්කාරයා—බද්දේගම පදිංචි රන්දෙනේකන්කානන්ගේ කරෝලිස්. | | | | |
| 1 | කැබඹළුවේකන්ද | රජසන්තක | බැද්ද | 0 3 4 | 100 |
| | සිතියම 10,833. ගම—උඌරල. මෙම ඉඩමට ඉල්ලුම්කාරයෙක් නැහැ. | | | | |
| 4 | ලේනුවල කුඹුරේගොඩ අද්දර වත්ත | ගාල්ලේ එලියවිපාරේ පදිංචි බී. බී. දවිත්හාමි | රබර් තිබෙන<br>වැවිල්ල | 0 0 23 | 60<br>14 |
| | සිතියම 10,837. ගම—ඇත්කඳුර. ඉල්ලුම්කාරයා—ඇත්කඳුරේ පදිංචි කේ. ඇම්. ජී. ඒබ්‍රහම් ගුණසේකර. | | | | |
| 1 | වතුරාවදෙනියනොහොත් කොලාවේ ගොඩදෙනිය | කේ. ඇම්. ජී. ඒබ්‍රහම් ගුණසේකර | වත්ත<br>වැවිල්ල | 0 2 38 | 50<br>12 |
| | මෙම ඉඩම්වලට ඉල්ලුම්කාරයෙක් නැහැ. | | | | |
| 2 | එම | ඇත්කඳුරේ පදිංචි ගුස්තින්හාමිගේ දෙන් ඔබ්රීස් ද සිල්වා | වත්ත<br>වැවිල්ල | 0 3 20 | 50<br>31·50 |
| 3 | එම | එම | වත්ත<br>වැවිල්ල | 0 0 32 | 50<br>6·50 |
| | සිතියම 10,842. ගම—බද්දේගම නැගෙනහිර. ඉල්ලුම්කාරයා—ගල්හේනේගේ ඒබ්‍රහම්. | | | | |
| 1 | ගුරුබැවිලේකන්ද | රජසන්තක | බැද්ද | 0 1 36 | 80 |
| 2 | එම | එම | බැද්ද (විකුණන්නේනැහැ) | 0 0 13 | —† |
| 3 | එම | එම | බැද්ද | 0 1 18 | 80 |
| | සිතියම 10,864. ගම—ලෙල්වල පහල. ඉල්ලුම්කාරයා—ලෙල්වල පදිංචි දෙන් දවිත් ඇපා සෙනෙවිරත්න. | | | | |
| 1 | ඊරියවලකන්දේකොරටුව නොහොත් පොල්ගහවලේකන්දේ කොරටුව | දෙන් දවිත් ඇපා සෙනෙවිරත්න | වත්ත | 0 2 38 | 50 |
| | සිතියම 10,875. ගම—පිටිතුරේ. ඉල්ලුම්කාරයා—කැරඳෙවෙල පදිංචි කේ. ඇම්. ජී. දෙන් එඩ්වින්. | | | | |
| 1 | කහටගහහේන නොහොත් බෝ කුරුකැටගොඩකන්ද | රජසන්තක | මහබැද්ද | 1 0 1 | 60 |

* මිනිරන් හෑරීමේ බලය ඇතුව රුපියල් 150යි. † නගරගම් ඉඩම.

මෙම ඉඩම් ගැන වැඩිපුර කාරණ අදාළ දිසාවේ ඒජන්ත උන්නාන්සේගෙන්ද, ඒවායේ සිතියම් සර්වෙයර් ජනරල් උන්නාන්සේ ගෙන්ද දැනගත හැකිය.

වෂී 1918ක්වූ අගෝස්තු මස 6වෙනි දින කොළඹ
මහලේකම්තානිස් උන්නාන්සේගේ කන්තෝරුවේදිය.

ඒ. ඇස්. පැග්ඩන්,
වැඩබලන මහලේකම්තානිස් වම්සා.

**No. 3,160, S. P.**—දකුණු දිසාවේ මාතර උපඒජන්ත උන්නාන්සේ විසින් මෙහි පහත සඳහන්වෙන ආණ්ඩුව සන්තක ඉඩම් ආණ්ඩුවේ ඉඩම් විකිනීම් නියෝගවල ප්‍රකාරයට වර්‍ෂ 1918ක්වූ සැප්තැම්බර් මස 14වෙනි දිනවූ සෙනසුරාදා පෙරවරු 10ට කච්චේරි‍යේ ගේ තානායමේදී වෙන්දේසිකර විකුණන්ට හෝ බේරුම්කරදෙන්ට නොහොත් වෙන අන්දමකින් තීන්දුකරන්ට යෙදෙනවා ඇත. දකුණු දිසාවේ මාතර පලාතේ ගඟබඩපත්තුවේ පිහිටා තිබෙන බිම්කැබලි 18ක්.

සිතියම 10,900. ගම—කිරින්දෙමයින් ඉහල. අයිතිකමකියන්නා—ආණ්ඩුව.

| අංකය. | ඉඩමේ නම. | ඉල්ලුම්කාරයා. | අන්දම. | මහත, අ. | රූ. | ප. | අක්කරයක මිල, රු. |
|---|---|---|---|---|---|---|---|
| 1 | ගොරකමන්ඩියේහේන්කැබෙල්ල | ආණ්ඩුව | පැහිරි | 0 | 0 | 35 | 75 |

සිතියම 10,849. ගම—වලකන්ද.

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 1 | ගහස්සකනත්තේහේන | ආණ්ඩුව | බැද්ද | 2 | 0 | 1 | 90 |

සිතියම 10,711. ගම—බටුවිට.

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 1 | අමුණෙහේනෙදෙනියේඅත්මග | ආණ්ඩුව | එම | 5 | 0 | 9 | 60 |
| 2 | එම | එම | එම | 0 | 3 | 38 | 60 |
| 3 | එම | එම | එම | 1 | 0 | 4 | 60 |
| 5 | එම | එම | එම | 1 | 0 | 4 | 60 |
| 6 | එම | එම | එම | 1 | 0 | 6 | 60 |

සිතියම 10,873. ගම—වලකන්ද.

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 1 | දෙලේවත්ත | ආණ්ඩුව | වත්ත | 0 | 3 | 6 | 60 |

සිතියම 10,729. ගම—වලකන්ද.

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 1 | ආගෙර්හේන නොහොත් දෙලපහලවත්ත | ආණ්ඩුව | පැහිරි | 1 | 0 | 0 | 50 |
| 2 | එම | එම | එම | 0 | 1 | 16 | 50 |
| 3 | පුන්චිඅරඹේහේන නොහොත් දෙලපහලවත්ත | එම | එම | 0 | 2 | 8 | 50 |
| 4 | ගොඩැල්ලේහේන | එම | බැද්ද | 0 | 3 | 7 | 60 |
| 5 | අඹගහහේන නොහොත් රනරලගේහේන | එම | පැහිරි | 0 | 2 | 9 | 50 |
| 6 | එම | එම | එම | 3 | 2 | 33 | 50 |

සිතියම 10,763. ගම—වලකන්ද.

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 2 | ගල්වලගාවාබැද්ද නොහොත් කොටුපලගාවාදෙනියේ අත්මග | ආණ්ඩුව | බැද්ද | 0 | 3 | 19 | 60 |
| 4 | එම | එම | පැහිරි | 4 | 3 | 16 | 50 |

සිතියම 32. ගම—කෙහෙල්වල.

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 1e | ඇටඹගහහේන නොහොත් පැතකන්ද | ඩී. ඇස්. අබයවික්‍රම | ආණ්ඩුව | 9 | 3 | 24 | 120 |

සිතියම 58. ගම—දිවිතුරේ.

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 46h | තැන්නපිටහේන නොහොත් සිරියන්දෙලේහේන | ආණ්ඩුව | අලංගත්හරිය | 1 | 3 | 24 | 75 |

මෙම ඉඩම් ගැණ වැඩිදුර කාරණා මාතර උපඒජන්ත උන්නාන්සේගෙන්ද ඒවායේ සිතියම් සර්වේයර් ජනරාල් උන්නාන්සේගෙන්ද ලබාගත හැකිය.

වර්‍ෂ 1918ක්වූ අගෝස්තු මස 7වෙනි දින කොළඹ මහලේකම් උන්නාන්සේගේ කන්තෝරුවේදීය.

ඒ. ඇස්. පැග්ඩන්,
වැඩබලන මහලේකම් වහන්සේ.

---

**No. 4,727, S. O.**—ඉඩම් බේරුම්කරණ කොමසාරිස් උන්නාන්සේ විසින් මෙහි පහත සඳහන්වෙන ආණ්ඩුව සන්තක ඉඩම් ආණ්ඩුවේ නියෝගවල ප්‍රකාරයට වර්‍ෂ 1918ක්වූ සැප්තැම්බර් මස 25වෙනි දිනවූ බදාදා පෙරවරු 9ට කචේරියේදී වෙන්දේසිකර විකුණන්ට හෝ නිරවුල්කරදෙන්ට යෙදෙනවා ඇත. දකුණු දිසාවේ හම්බන්තොට පලාතේ බස්නාහිර ගිරුවා පත්තුවේ කොරලයේ පිහිටාතිබෙන බිම්කැබලි 3ක්.

ලංකාමැනීමේ සිතියම 312.—සිව්නමල්ලුව.

| අංකය. | ඉඩමේ නම. | අයිතිකමකියන්නා. | අන්දම. | මහත, අ. | රූ. | ප. |
|---|---|---|---|---|---|---|
| 209 | කපාපුවරවත්ත | බෙලිඅත්තෙ පදිංචි දෙන් ඩේවිඩ් අබයසූරිය | පැහිරි | 28 | 1 | 28 |
| 209x | එම | බෙලිඅත්තෙ පදිංචි (1) දෙන් අන්දිරිස් ද සිල්වා, (2) දෙන් ඩේවිඩ් අබයසූරිය | එම | 17 | 2 | 29 |
| 209y | එම | එම | එම | 11 | 3 | 9 |

අක්කරයක තක්සේරු මිල රුපියල් 15 සිට රුපියල් 50 දක්වාය.

මෙම ඉඩම් ගැන වැඩිදුර තොරතුරු ඉඩම් බේරුම්කරණ කොමසාරිස් උන්නාන්සේගෙන්ද, ඒවායේ සිතියම් සර්වේයර් ජනරල් උන්නාන්සේගෙන්ද දැනගත හැකිය.

වර්‍ෂ 1918ක්වූ අගෝස්තු මස 7වෙනි දින කොළඹ මහලේකම් උන්නාන්සේගේ කන්තෝරුවේදීය.

ඒ. ඇස්. පැග්ඩන්,
වැඩබලන මහලේකම් වහන්සේ.

---

**No. 4,728, S. O.**—ඉඩම් බේරුම්කරණ කොමසාරිස් උන්නාන්සේ විසින් මෙහි පහත සඳහන්වෙන ආණ්ඩුව සන්තක ඉඩම් ආණ්ඩුවේ නියෝගවල ප්‍රකාරයට වර්‍ෂ 1918ක්වූ සැප්තැම්බර් මස 20වෙනි දිනවූ සිකුරාදා පෙරවරු 11ට නාවලගම කුඩාරමේදී වෙන්දේසිකර විකුණන්ට හෝ බේරුම්කරදෙන්ට යෙදෙනවා ඇත. ඌව දිසාවේ බදුල්ල පලාතේ කඳුකරකෝරළේ පිහිටාතිබෙන බිම්කැබෙලි 2ක්.

ලංකාමැනීමේ සිතියම 217.—අඹුනුමුල්ල.

| අංකය. | ඉඩමේ නම. | අයිතිකමකියන්නා හෝ ඉල්ලුම්කාරයා. | අන්දම. | මහත, අ. | රූ. | ප. |
|---|---|---|---|---|---|---|
| 9s | දඹගහහේන | ආණ්ඩුව, කේ. එච්. අප්පුහාමි විසින් ඉල්ලුම්කර තිබෙන | හේන | 1 | 0 | 9 |

| නො. | ඉඩමේ නම. | අයිතිකමකියන්නා හෝ ඉල්ලුම්කාරයා. | අන්දම. | මහත, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 91 | දඹගහහේන | .. ආණ්ඩුව, බී. ඇස්. ඇම්. රම්මැනිකා විසින් ඉල්ලම්කර තිබෙන .. | හේන | .. 1 1 37 |

අක්කරයක තක්සේරු මිල රුපියල් 15 සිට රුපියල් 50 දක්වාය.

මෙම ඉඩම් ගැන වැඩිදුර තොරතුරු ඉඩම් බේරුම්කරණ කොමසාරිස් උන්නාන්සේගෙන්ද, ඒවාගේ සිතියම් සර්වේයර් ජනරාල් උන්නාන්සේගෙන්ද ලබාගත හැකිය.

වර්‍ෂ 1918ක්වූ අගෝස්තු මස 7වෙනි දින කොළඹ
මහලේකම්තාරිස් උන්නාන්සේගේ කන්තෝරුවේදීය.

ඒ. ඇස්. පැග්ඩන්,
වැඩබලන මහලේකම්තාරිස් වම්ශ.

---

**No. 4,729, S. O.**—ඉඩම් බේරුම්කරණ කොමසාරිස් උන්නාන්සේ විසින් මෙහි පහත සඳහන්වෙන අණ්ඩුව සන්තක ඉඩම ආණ්ඩුවේ නියෝගවල ප්‍රකාරයට වර්‍ෂ 1918ක්වූ සැප්තැම්බර් මස 23වෙනි දිනවූ සඳුදා පෙරවරු 11ට බන්ඩාරවෙලදී වෙන්දේසිකර විකුණන්ට හෝ බේරුම්කරදෙන්ට යෙදෙනවා ඇත. ඌව දිසාවේ බදුල්ල පලාතේ දඹවිනිපලාතකෝරළේ පිහිටා තිබෙන බිම්කැබලි 1ක්.

ලංකාමැනීමේ සිතියම 191.—උඩලකුඹුර.

| නො. | ඉඩමෙ නම. | අයිතිකමකියන්නා හෝ ඉල්ලම්කාරයා. | අන්දම. | මහත, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 34 | අස්වැද්දුමදෙනිය | .. (1) වාගල්පේඩිගෙ හීන්කිරා, (2) එම මැනිකා, (3) එම ගරුව, (4) එම හිංයිරී .. .. .. | දෙනිය | .. 1 3 17 |

අක්කරයක මිල රුපියල් 15 සිට රුපියල් 50 දක්වාය.

මෙම ඉඩම ගැන වැඩිදුර තොරතුරු ඉඩම් බේරුම්කරණ කොමසාරිස් උන්නාන්සේගෙන්ද, ඒකේ සිතියම සර්වේයර් ජනරාල් තුමාගෙන්ද ලබාගත හැකිවේ.

වර්‍ෂ 1918ක්වූ අගෝස්තු මස 7වෙනි දින කොළඹ
මහලේකම්තාරිස් උන්නාන්සේගේ කන්තෝරුවේදීය.

ඒ. ඇස්. පැග්ඩන්,
වැඩබලන මහලේකම්තාරිස් වම්ශ.

---

## ආණ්ඩුවට ඉඩම් ලබාගැණීම සම්බන්ධ දැන්වීම.

වර්‍ෂ 1876ක්වූ අවුරුද්දේ නොම්මර 3නේ ආඥාපත්‍රයේ හත්වෙනි වගන්තියේ ප්‍රකාරයට ආණ්ඩුවේ කටයුත්තකට, එනම්:—අලුත් පාරකට, කන්කුස්සියකටද සහ තව ඕනෑකමකට පිණිස මෙහි පහත සඳහන්වෙන ඉඩම් ලබාගැණීම සඳහා ක්‍රියාකරන පිණිස "වර්‍ෂ 1876යේ ඉඩම් ලබාගැණීමේ ආඥාපත්‍රයේ" හයවෙනි කාණ්ඩයේ කරතිබෙන පංගාර්තුවල ප්‍රකාරයට කාරක මන්ත්‍රිසභාවේ මන්ත්‍රණය ඇතුව උතුමාණන්වහන්සේගෙන් නිසිආකාර මට අණලැබී තිබේ, ඒ ඉඩම්නම්:—

සිතියම 16,784. ගම—මිනුවන්ගොඩ.

| නො. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකමකියන්නා. | මහත, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 1 | තල්ගහවත්ත | .. පොල් සහ වෙනගස්ද, ලිඳක්ද, අතුසෙවිල්ලපු ගෙවල් 2ක්ද තිබේ .. | .. ජී. බී. මැල් සහ තවත් අය | .. 0 2 14·2 |
| 2 | කහටගහවත්ත | .. පොල් ඉඩම උලුහෙවිල්ලපු ගෙයක් තිබේ | .. තෝමස් අල්පොන්සො සහ තවත් කෙනෙක් .. | .. 0 0 5·5 |
| 3 | එම | .. එම .. | .. චාර්ලිස් පොන්සේකා | .. 0 0 1·6 |
| 4 | කල්දරත්වත්ත | .. පොල් ඉඩම උලුහෙවිල්ලපු ගෙයක කොටසක් තිබේ .. | .. පේදුරු දියස්ගෙ උරුමක්කාරයෝ | . 0 1 37 |

එබැවින් ඉඩම් අයිතිකරගැනීමට ආණ්ඩුවේ කල්පනාව තිබෙන බව පොදුජනයාට දැනගැන්ම සඳහා හත්වෙනි වගන්තියේ ඕනෑකර තිබෙන හැටියට මෙයින් දැනුම්දෙමි.

ඉහතකී ඉඩම්වලට අයිතිවාසිකම් ඇත්තාවූ සැමදෙනම තමුන්ම නොහොත් තමුන් වෙනුවට ක්‍රියාකරණ අය වර්‍ෂ 1918ක්වූ සැප්තැම්බර් මස 2වෙනි දින දවල් 12.15ගේ කනිසමට මෙම කන්තෝරුවේදී මා ඉදිරිපිටට පැමිණ ඒ කොයි අන්දමේ අයිතිවාසිකම්ද කියා කියාසිටින්ට ඕනෑවා සහ මෙම ඉඩම් වෙනුවට ඉල්ලාසිටින මුදල් ගණනත් ඊට ඇත්තාවූ තමුන්ගේ අයිතිකමේ තොරතුරුත් කියාසිටින්ට ඕනෑ බව මෙයින් දැනගත යුතුයි.

වර්‍ෂ 1918ක්වූ අගෝස්තු මස 5වෙනි
දින කොළඹ කච්චේරියේදීය.

ජේ. ජී. ෆ්‍රේසර්,
ආණ්ඩුවේ ඒජන්ත වම්ශ.

---

වර්‍ෂ 1876ක්වූ අවුරුද්දේ නොම්මර 3නේ ආඥාපත්‍රයේ හත්වෙනි වගන්තියේ ප්‍රකාරයට, ආණ්ඩුවේ කටයුත්තකට, එනම්:—දනෝවිට පිරිමි ලමයින්ට සෙකොලය සාදනතැනට පාරක් සෑදීම පිණිස මෙහි පහත සඳහන්වෙන ඉඩම් ලබාගැණීම සඳහා ක්‍රියාකරණ පිණිස "වර්‍ෂ 1876යේ ඉඩම් ලබාගැණීමේ ආඥාපත්‍රයේ" හයවෙනි කාණ්ඩයේ කරතිබෙන පංගාර්තුවල ප්‍රකාරයට කාරක මන්ත්‍රිසභාවේ මන්ත්‍රණය ඇතුව උතුමාණන්වහන්සේගෙන් නිසිආකාර මට අණලැබී තිබේ, ඒ ඉඩම්නම්:—

සිතියමේ 16,788. ගම—දනෝවිට.

| නො. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකමකියන්නා. | මහත, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 1 | බෝගහවත්ත | .. පොල්ගස් 5ක්ද, පුවක්ගහක්ද තිබේ .. | මෙරයා එන්ගල්තිනා දිසානායක | .. 0 0 6 |
| 2 | අස්වැද්දුමකුඹුර | . කුඹුර .. | .. විජේබමුනු ජේම්ස් පෙරේරා සහ වෙන අය | 0 0 0·37 |
| 3 | බෝගහවත්ත | .. පොල්ගස් 6ක්ද, කොස්ගහක්ද, පාරක්ද තිබේ .. | .. විජේබමුනු ජේම්ස් පෙරේරා | .. 0 0 8·09 |

| නො. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකමකියන්නා. | මහත, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 4 | අස්වැද්දුමකුඹුර | .. කුඹුර .. | .. ඕ. වී. පෙරත් සහ සහෝදරයන් | .. 0 0 15·78 |
| 5 | එම | .. වතුරපාර .. | .. එම .. | .. 0 0 0·81 |

එබැවින් ඉඩම් අයිතිකර ගැණීමට ආණ්ඩුවේ කල්පනාව තිබෙන බව පොදුජනයාට දැනගැන්ම සඳහා හත්වෙනි වගන්තියේ ඕනෑකරතිබෙන හැටියට මෙයින් දැනුම්දෙමි.

ඉහතකී ඉඩම්වලට අයිතිවාසිකම් ඇත්තාවූ සැමදෙනම තමුන්ම නොහොත් තමුන් වෙනුවට ක්‍රියාකරණ අය වර්‍ෂ 1918ක්වූ සැප්තැම්බර් මස 2වෙනි දින දවල් 12ට කනිසමට මෙම කන්තෝරුවේදී මා ඉදිරිපිටට පැමිණ ඒ කොයි අන්දමේ අයිතිවාසිකම්ද කියා කියාසිටින්ට ඕනෑවා සහ මෙම ඉඩම් වෙනුවට ඉල්ලාසිටින මුදල් ගණනත් ඒව ඇත්තාවූ තමුන්ගේ අයිතිකමේ තොරතුරුත් කියා සිටින්ට ඕනෑ බව මෙයින් දැනගත යුතුයි.

වර්‍ෂ 1918ක්වූ අගෝස්තු මස 5වෙනි දින කොළඹ කච්චේරියේදීය.

ජේ. ජී. ෆ්‍රේසර්,
ආණ්ඩුවේ ඒජන්ත වර්‍ගහ.

---

වර්‍ෂ 1876ක්වූ අවුරුද්දේ නොම්මර 3ගේ ආඥාපත්‍රයේ හත්වෙනි වගන්තියේ ප්‍රකාරයට ආණ්ඩුවේ කටයුත්තකට, එනම්:—පුවරිසන්කුලමේ තහනම් කැලේට අඩංගුකිරීම පිණිස මෙහි පහත සඳහන්වෙන ඉඩම ලබාගැනීම සඳහා ක්‍රියාකරණ පිණිස "වර්‍ෂ 1876යේ ඉඩම් ලබාගැණීමේ ආඥාපත්‍රයේ" හයවෙනි කාණ්ඩයේ කරතිබෙන පංගාර්තුවල ප්‍රකාරයට කාරක මන්ත්‍රිසභාවේ මන්ත්‍රණය ඇතුව උතුමාණන්වහන්සේගෙන් නිසිආකාර මට අණලැබී තිබේ, ඒ ඉඩම නම්:—

සිතියම 5,041. ගම—තුවරන්කුලම්.

| නො. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකමකියන්නා. | මහත, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 1 | තුවරන්කුලත්තුවයල් | .. අත්හරිනලද වෙල | .. නාකන් අයියන් | .. 2 3 36 |

එබැවින් ඉඩම අයිතිකරගැණීමට ආණ්ඩුවේ කල්පනාව තිබෙන බව පොදුජනයාට දැනගැන්ම සඳහා හත්වෙනි වගන්තියේ ඕනෑකර තිබෙන හැටියට මෙයින් දැනුම්දෙමි.

ඉහතකී ඉඩමට අයිතිවාසිකම් ඇත්තාවූ සැමදෙනම තමුන්ම නොහොත් තමුන් වෙනුවට ක්‍රියාකරණ අය වර්‍ෂ 1918ක්වූ අගෝස්තු මස 28වෙනි දින දවල් 12ට කනිසමට වවුනියාවේදී මා ඉදිරිපිටට පැමිණ ඒ කොයිඅන්දමේ අයිතිවාසිකම්ද කියා කියාසිටින්ට ඕනෑවා සහ මෙම ඉඩම් වෙනුවට ඉල්ලාසිටින මුදල් ගණනත් ඒට ඇත්තාවූ තමුන්ගේ අයිතිකමේ තොරතුරුත් කියාසිටින්ට ඕනෑ බව මෙයින් දැනගත යුතුයි.

වර්‍ෂ 1918ක්වූ ජූලි මස 22වෙනි දින මුල්ලද්දුව කච්චේරියේදීය.

සී. ඩබ්ලිව්. බික්මෝර්,
ආණ්ඩුවේ උපඒජන්ත වර්‍ගහ.

---

වර්‍ෂ 1876ක්වූ අවුරුද්දේ නොම්මර 3ගේ ආඥාපත්‍රයේ හත්වෙනි වගන්තියේ ප්‍රකාරයට ආණ්ඩුවේ කටයුත්තකට, එනම්:—හත්නාගොඩ ඉස්කෝලයට සහ වත්තට මෙහි පහත සඳහන්වෙන ඉඩම ලබාගැණීම සඳහා ක්‍රියාකරණ පිණිස "වර්‍ෂ 1876යේ ඉඩම් ලබාගැණීමේ ආඥාපත්‍රයේ" හයවෙනි කාණ්ඩයේ කරතිබෙන පංගාර්තුවල ප්‍රකාරයට කාරක මන්ත්‍රිසභාවේ මන්ත්‍රණය ඇතුව උතුමාණන්වහන්සේගෙන් නිසිආකාර මට අණලැබී තිබේ, ඒ ඉඩමනම්:—

සිතියම 2,774. ගම—හත්නාගොඩ.

| නො. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකමකියන්නා. | මහත, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 1 | හිට්නාවත්ත නොහොත් පරණවත්ත | .. පොල්ආදිය | ඩබ්ලිව්. ඇම්. ලොකුබන්ඩා, එම පුංචිබන්ඩා, එම ටිකිරිබන්ඩා, උක්කුබන්ඩා .. .. | .. 1 0 12·1 |

එබැවින් ඉඩම අයිතිකරගැණීමට ආණ්ඩුවේ කල්පනාව තිබෙන බව පොදුජනයාට දැනගැන්ම සඳහා හත්වෙනි වගන්තියේ ඕනෑකර තිබෙන හැටියට මෙයින් දැනුම්දෙමි.

ඉහතකී ඉඩමට අයිතිවාසිකම් ඇත්තාවූ සැමදෙනම තමුන්ම නොහොත් තමුන් වෙනුවට ක්‍රියාකරණ අය වර්‍ෂ 1918ක්වූ සැප්තැම්බර් මස 10වෙනි දින පස්වරු 1.30 කනිසමට කෑගල්ලේ කච්චේරියේදී මා ඉදිරිපිටට පැමිණ ඒ කොයි අන්දමේ අයිතිවාසිකම්ද කියා කියාසිටින්ට ඕනෑවා සහ මෙම ඉඩම වෙනුවට ඉල්ලාසිටින මුදල් ගණනත් ඒට ඇත්තාවූ තමුන්ගේ අයිතිකමේ තොරතුරුත් කියාසිටින්ට ඕනෑ බව මෙයින් දැනගත යුතුයි.

වර්‍ෂ 1918ක්වූ අගෝස්තු මස 10වෙනි දින කෑගල්ලේ කච්චේරියේදීය.

ජී. ඇජ්. ආර්. බ්‍රවුනින්,
ආණ්ඩුවේ උප ඒජන්ත වර්‍ගහ.

---

## මුඩුඉඩම් නිරවුල්කිරීම සම්බන්ධ ප්‍රාරම්භ දැන්වීම.

[කුරුණෑගල දැන්වීම නො. 6,986.]

වර්‍ෂ 1918ක්වූ අගෝස්තු මස 9වෙනි දින පටන් තුන්මාසයක් ඇතුළතදී මෙහි පහත දක්වන ඉඩමට හෝ එයින් කොටසකට හෝ යම් අයිතිකමක් තිබෙනවාය කියන යම් අයවල් ඇත්නම් ඒ අය විසින් මුඩුබිම් සම්බන්ධව වර්‍ෂ 1897, 1899, 1900 සහ 1903ගේ ආඥාපණත්වල 28වෙනි වගන්තියේ ප්‍රකාරයට පත්කරනුලැබූ විශෙෂ මන්ත්‍රීශ්වරයානන්නාන්සේගේ කොළඹ කන්තෝරුවේදී ඇන්. ඒ. හැම්ප්ටන් උන්නාන්සේගේ ඉදිරිපිටට ඇවිත් පෙනීසිට හෝ ලියවිල්ලකින් එකී ඉඩමට හෝ එහි කොටසකට අයිතිකම් පෙන්වා සිටින්ට නොයෙදුනොත්, එකී විශෙෂ මන්ත්‍රීශ්වරයානන්නාන්සේට ඉහතකී ආඥාපණත්වලින් ලැබී තිබෙන බලවල ප්‍රකාරයට, අයිතිවාසිකම් නොකියාපු එකී ඉඩම රජසන්තක ඉඩමක්ය කියා උන්නාන්සේගේ අත්සන ඇති ලියවිල්ලකින් උන්නාන්සේ විසින් ප්‍රකාශකරණ බව මෙයින් දැනගත යුතුයි.

ඇන්. ඒ. හැම්ප්ටන්,
විශෙෂ මන්ත්‍රීශ්වරයානන්නාන්සේ.

ඉඩමේ තොරතුරු.

වයඹ දිසාවේ කුරුණෑගල දිස්ත්‍රික්කේ දඹදෙනිහත්පත්තුවේ දකුණු උඩුකහකෝරළේ ඉබ්බල්ගොඩනගම පිහිටා තිබෙන මිට අමුනාපු සිතියමේ* පෙනියන 480 මුල් සිතියමේ 1ත් ජේන රූඩ්ස් 3කුත් පර්චස් 9ක් බිම්තරම ඇති සාමාන්‍ය වශයෙන් කොස්ගහමුලවත්ත කියන නොහොත් ඒ නමින් දැනගෙන තිබෙන බිම්කට්ටියට මායිම්:—උතුරට කොස්ගොල්ල ඇලෙන් කොටසක්ද (මඩවල යන ගමේ ගම්ඉමද); නැගෙණහිරට එච්. උන්ගුහාමි සහ තවත් කෙනෙක් විසින් අයිතිකම්කියන කොස්ගොල්ලවත්තද; දකුණට ආණ්ඩුව විසින් විකුණපු කොස්ගොල්ලෙවත්තද (327,960 පිඹුරුකඩදාසියේ පෙනෙන ඉඩම); බස්නාහිරට ආණ්ඩුව විසින් වගකියන බෝගහමුලවත්තද, කොස්ගොල්ලෙ ඇලෙන් කොටසක්ද, මඩවල යන ගමේ ගම්ඉමද.

* ඉංග්‍රීසි පිටපතේ තුන්වෙනි කාණ්ඩයේ 1453වෙනි පිටේ ප්ලෑනය බලනු.

[කුරුණෑගල වී. ම. 96—1918.]

[කුරුණෑගල දැන්වීම නො. 6,987.]

වර්ෂ 1918ක්වූ අගෝස්තු මස 9වෙනි දින පටන් තුන්මාසයක් ඇතුළතදී මෙහි පහත දක්වන ඉඩමට හෝ එයින් කොටසකට හෝ යම් අයිතිකමක් තිබෙනවාය කියන යම් අයෙක් ඇත්නම් ඒ අය විසින් මුඩුබිම් සම්බන්ධව වර්ෂ 1897, 1899, 1900යේ සහ 1903යේ ආඥාපනත්වල 28වෙනි වගන්තියේ ප්‍රකාරයට පත්කරතුලැබූ විශෙෂ මන්ත්‍රීශ්වරයානන්නාන්සේගේ කොළඹ කන්තෝරුවේදී ඇන්. ඒ. හැම්ප්ටන් උන්නාන්සේගේ ඉදිරිපිටට ඇවිත් පෙනීසිට හෝ ලියවිල්ලකින් එකී ඉඩමට හෝ එකී කොටසකට අයිතිකම පෙන්වාසිටින්ට නොයෙදුනොත් එකී විශෙෂ මන්ත්‍රීශ්වරයානන්නාන්සේට ඉහතකී ආඥාපනත්වලින් ලැබීතිබෙන බලවල ප්‍රකාරයට, අයිතිවාසිකම් නොකියාපු එකී ඉඩම රජසන්තක ඉඩමක්ය කියා උන්නාන්සේගේ අත්සන ඇති ලියවිල්ලකින් උන්නාන්සේ විසින් ප්‍රකාශකරණ බව මෙයින් දැනගත යුතුයි.

ඇන්. ඒ. හැම්ප්ටන්,
ඉඩම් තොරතුරු. විශෙෂ මන්ත්‍රීශ්වරයානන්නාන්සේ.

වයඹ දිසාවේ කුරුණෑගල දිස්ත්‍රික්කේ දිස්ත්‍රික්කේ හිරියාලහත්පත්තුවේ මහගල්බොඩඑගොඩකෝරළේ කුරුන්දුල්ල යන ගම පිහිටා තිබෙන මිට අමුනාපු සිතියමේ* පෙනීයන 2,039 මුල් සිතියමේ 10,067න් පෙනෙන අක්කර 6කුත් පර්චස් 21ක් බිම්තරම් ඇති සාමාන්‍ය වසගෙන් ගල්වැටියපාවුලහේන කියන නොහොත් ඒ නමින් දැනගෙන තිබෙන බිම්කට්ටියට මායිම් :— උතුරට, නැගෙණහිරට සහ දකුණට මුඩුබිම් සම්බන්ධ රෙගුලාසිය යටතේ විකුණපු ඉද්දපිටියහේනද ; බස්නාහිරට තඹගල්ල යන ගමේ ගම්ඉමද.

* ඉංග්‍රීසි පිටපතේ තුන්වෙනි කාණ්ඩයේ 1453වෙනි පිටේ ප්ලෑනය බලනු.

[කුරුණෑගල බි. ම. 97—1918.]

---

[කොළඹ දැන්වීම නො. 6,988.]

වර්ෂ 1897යේ, 1899යේ, 1900යේ සහ 1903යේ මුඩු ඉඩම් සම්බන්ධ ආඥාපනත් ප්‍රකාර දැනුම්දීම.

මෙහි පහත සඳහන්වෙන ඉඩම් සම්බන්ධව අයිතිවාසිකමක් ඇති කෙනෙක් ඉන්නවානම් ඒ අය වර්ෂ 1918ක්වූ අගෝස්තු මස 9වෙනි දින පටන් තුන්මාසයක් ඇතුළත කොළඹ කච්චේරියට ඇවිත් බස්නාහිර දිසාවේ කොළඹ සහ මීගමු දිස්ත්‍රික්කවල ආණ්ඩුවේ උප ඒජන්ත උන්නාන්සේ ඉදිරිපිට පෙනීසිට එකී ඉඩම්වලට හෝ ඉන් කොයිසම්වූ එකකට තමුන් තිබෙන අයිතිකම නොහොත් ඒ සම්බන්ධව තිබෙන වැදගත්කම කියා නොසිටියොත් එකී උප ඒජන්ත උන්නාන්සේ විසින් වර්ෂ 1897යේ 1වෙනි ආඥාපනතෙන් උන්නාන්සේට ලැබී තිබෙන බලපූර්වත්කම්වල ප්‍රකාරයට, අයිතිකමක් කියා නොසිටිය ඒ ඉඩම් රජසන්තක ඉඩම් බව උන්නාන්සේගේ අත්සන ඇති ලියවිල්ලකින් එළිදරව්කරණ බව මෙයින් දැනගත යුතුයි.

ඩබ්ලිව්. කේ. එච්. කැම්බල්,
කොළඹ සහ මීගමු දිස්ත්‍රික්කවල ආණ්ඩුවේ උප ඒජන්ත වම්හ.

කියන්නේ මේ ඉඩම් ගැනයි.

මිට යාකරණලද සිතියමේ* සඳහම්වූ බස්නාහිර දිසාවේ කොළඹ දිස්ත්‍රික්කුවේ හේවාගම්කෝරළේ උඩුගහපත්තුවේ ගිරඹුල යන ගම පිහිටි මෙහි පහත පෙනෙන බිම්කට්ටි :—

මුල් සිතියම 16,320.

| බිම්කට්ටිය. | ඉඩමේ නම. | බිම්තරම, අ. | රූ. | ප. |
|---|---|---|---|---|
| 1 | කැලගහවත්ත .. .. | 0 | 1 | 1 |
| 2 | එම .. .. | 0 | 2 | 5 |
| 3 | රුක්අත්තනගහවත්ත .. | 0 | 0 | 23 |
| 4 | ගොඩැලඩවත්ත .. .. | 0 | 2 | 37 |
| 5 | එම .. .. | 0 | 0 | 7 |
| 6 | රුක්අත්තනගහවත්ත (පාරට තහනම්) .. | 1 | 0 | 25 |
| 7 | එම .. .. | 0 | 0 | 3 |
| 8 | එම .. .. | 0 | 1 | 20 |
| | | 3 | 1 | 1 |

මෙහි පහත සඳහම්වූ මායිම්—උතුරට කොකුනාගුරු විසින් අයිතිකම්කියා සිටින කැලගහවත්තද ; නැගෙණහිරට චාර්ලිස් අප්පු සහ තවත් අය විසින් අයිතිකම්කියන කැබෙල්ලගහකුඹුරද, ඩබ්ලිව්. පිලෝරිස් සහ තවත් අය විසින් අයිතිකම් කියාසිටින නැපිල්ලෑවේ ඔවිටද ; දකුණට ඩබ්ලිව්. පිලෝරිස් සහ තවත් අය විසින් අයිතිකම්කියාසිටින නැපිල්ලෑවේ ඔවිට සහ බස්නාහිරට චාර්ලිස්අප්පු විසින් අයිතිකම්කියාසිටින දෙහිගහවත්තේ ඔවිටද, ජී. ප්‍රනාන්දු විසින් අයිතිකම්කියාසිටින රුක්අත්තනගහවත්තද, ඇම්. බෙලේනිස්අප්පු විසින් අයිතිකම්කියාසිටින රුක්අත්තනගහවත්තද, ඩබ්ලිව්. අගෝලිස් සහ තවත් අය විසින් අයිතිකම්කියාසිටින ගොඩැලඩවත්තද, ඇම්. මර්තේලිස් විසින් අයිතිකම්කියාසිටින රුක්අත්තනගහවත්තද, ඩබ්ලිව්. අගෝලිස් සහ තවත් අය විසින් අයිතිකම්කියාසිටින කැලගහවත්ත සහ ඩබ්ලිව්. පීටර්ටත් අයිති කැලගහවත්තත්ය.

* ඉංග්‍රීසි පිටපතේ තුන්වෙනි කාණ්ඩයේ 1454වෙනි පිටේ ප්ලෑනය බලනු.

---

[කළුතර දැන්වීම නො. 6,989.]

වර්ෂ 1918ක්වූ අගෝස්තු මස 9වෙනි දින පටන් තුන්මාසයක් ඇතුළත මෙහි පහත දක්වන ඉඩම්වලට නොහොත් ඉන් එකකට නොහොත් වැඩි ගණනකට යම් අයිතිවාසිකමක් තිබෙන යම් අයවල් ඇත්නම් ඒ අයවලුන් විසින් මුඩුබිම් සම්බන්ධව වර්ෂ 1897, 1899, 1900 සහ 1903යේ ආඥාපනත්වල ප්‍රකාරයට පත්කරතුලැබූ කළුතර කච්චේරියේ උපඒජන්ත උන්නාන්සේ ඉදිරිපිට ඇවිත් පෙනීසිට එකී ඉඩම්වලට නොහොත් ඒට ඇති යම් කොටසකට කිසි අයිතිවාසිකමක් පෙන්වාසිටින්ට නොයෙදුනොත්, එකී උපඒජන්ත උන්නාන්සේට ඉහතකී ආඥාපනත්වලින් ලැබී තිබෙන බලවල ප්‍රකාරයට, අයිතිවාසිකම් නොකියාපු එකී ඉඩම් රජසන්තක ඉඩම් හැටියට උන්නාන්සේගේ අත්සන ඇති ලියවිල්ලකින් උන්නාන්සේ විසින් ප්‍රකාශකරණ බව මෙයින් දැනගත යුතුයි.

සී. වී. බ්‍රෞන්,
ඉඩම්වල තොරතුරු. ආණ්ඩුවේ උපඒජන්ත උන්නාන්සේ වම්හ.

බස්නාහිර දිසාවේ කළුතර දිස්ත්‍රික්කේ රයිගම්කෝරළේ මුන්වත්තේබාගේපත්තුවේ දෙඹගොඩ යන ගම පිහිටාතිබෙන මිට අමුනාපු සිතියම්වල* පෙනීයන මෙහි පහත දක්වන බිම්කට්ටි එනම් :—

I.—මුල් සිතියම 16,362.

| බිම්කට්ටිය. | ඉඩමේ නම. | බිම්තරම, අ. | රූ. | ප. |
|---|---|---|---|---|
| 1 .. | කොස්ගහවත්ත .. .. .. .. | 0 | 1 | 27 |

මිට මායිම—උතුරට සහ නැගෙනහිරට රජසන්තක හලන්කන්දද ; දකුණට නොම්මර 130,583 පඹුරුකඩදසියේ පෙනෙන ඉඩම සහ බස්නාහිරට රජසන්තක හලන්කන්දද.

* ඉංග්‍රීසි පිටපතේ තුන්වෙනි කාණ්ඩයේ 1455වෙනි පිටේ ප්ලෑනය බලනු.

II.—මුල් සිතියම 16,362.

| බිම්කට්ටිය. | ඉඩමේ නම. | බිම්තරම, අ. රූ. ප. |
|---|---|---|
| 2 | දෙල්ගහවත්ත | 0 0 29 |

මීට මායිම්—උතුරට රජසන්තක හලන්කන්දද; නැගෙනහිරට නොම්මර 130,583 පිඹුරුකබඳසියේ පෙනෙන ඉඩමද; දකුණට නොම්මර 190,010 පිඹුරුකබඳසියේ පෙනෙන ඉඩම සහ බස්නාහිරට පොඩිසිංඤෝ සහ තවත් අය විසින් අයිතිකම් කියන දෙල්ගහවත්තද, රජසන්තක හලන්කන්දද.

---

[හම්බන්තොට දැන්වීම නො. 6,990.]

වර් 1897, 1899, 1900 සහ 1903යේ මුඩුඉඩම් සම්බන්ධ ආඥාපණත් ප්‍රකාර දැනුම්දීම.

වර් 1918ක්වූ අගෝස්තු මස 9වෙනි දින පටන් තුන්මාසයක් ඇතුළතදී මෙහි පහත දක්වන ඉඩමට හෝ එයින් කොටසකට හෝ යම් අයිතිකමක් තිබෙනවාය කියන යම් අයෙක් ඇත්නම් ඒ අය විසින් හම්බන්තොට දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ උපජ්ජන්ත උන්නාන්සේ ඉදිරිපිටට ඇවිත් පෙනීසිට හෝ ලියවිල්ලකින් එකී ඉඩමට හෝ එහි කොටසකට අයිතිකම පෙන්වා සිටින්ට නොයෙදුනොත්, එකී ආණ්ඩුවේ උපජ්ජන්ත උන්නාන්සේට එකී ආඥාපණත්වලින් ලැබීතිබෙන බලවල ප්‍රකාරයට අයිතිවාසිකම් නොකියාපු එකී ඉඩම රජසන්තක ඉඩමක්ය කියා උන්නාන්සේගේ අත්සන ඇති ලියවිල්ලකින් උන්නාන්සේ විසින් ප්‍රකාශකරණ බව මෙයින් දැනගත යුතුයි.

ඩබ්ලිව්. ඇල්. මර්ෆි,
ඉඩමේ තොරතුරු. ආණ්ඩුවේ උපජ්ජන්ත තැන.

දකුණු දිසාවේ හම්බන්තොට දිස්ත්‍රික්කයේ බස්නාහිර ගිරුවාපත්තුවේ වරපිටිය යන ගමේ පිහිටා තිබෙන මීට අමුනාපු සිතියමේ* පෙනීයන 52 මුල් සිතියමේ 1902න් පෙනෙන පර්චස් 13ක් බිම්තරම ඇති සාමාන්‍ය වසයෙන් බැම්මගාවේ කොරටුව (පාරට ඇරපු කෑල්ල) කියන නොහොත් ඒ නමින් දැනගෙන තිබෙන බිම්කට්ටියට මායිම්:—

උතුරට ආණ්ඩුවට අයිති මුලන්කොලගේගේ කැබැල්ල; නැගෙණහිරට ආණ්ඩුවට අයිති කිරමවැව; දකුණට ආණ්ඩුවට අයිති වැකන්ඩිය; බස්නාහිරට වලස්මුල්ලේ සිට ඌරුබොක්කට යන ගම්සබාපාර.

* ඉංග්‍රීසි පිටපතේ තුන්වෙනි කාණ්ඩයේ 1455වෙනි පිටේ ප්ලෑනය බලනු.

---

## ඉල්ලුම්පත්‍ර සඳහා කරණලද දැන්වීම්.

වර් 1918ක්වූ සැප්තැම්බර් මස 1වෙනි දින පටන් 1919යේ දෙසැම්බර් මස 31වෙනි දිනෙන් අවසාන මාස කාලයට මෙහි පහත සඳහන්වෙන බස්නාහිර පලාතේ පාලම් රේන්දය වර් 1918ක්වූ අගෝස්තු මස 22වෙනි බෘහස්පතින්දා දවල් 12ට කොළඹ කච්චේරියේදී බස්නාහිර පලාතේ ප්‍රොවින්ෂල් රෝඩ් කොමිටියේ ප්‍රධානතැන විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

පිළිගනුලැබූ වැඩිඉල්ලුම්කාරයා විසින් දහසය මාසේට තත් මුදලෙන් දහයෙන් කොටසක් සල්ලිවලින් වහාම මෙහි තබන්නට ඕනෑය. එම ඉල්ලීම ප්‍රොවින්ෂල් රෝඩ් කොමිටියේ ප්‍රධානතැන විසින් භාරගන්නට යෙදුනොත්නම්, ඔහුගේ ඉල්ලීම උතුමාණන්වහන්සේ විසින් ඒත්තුගත් බව දැනුම්දුන් දින පටන් 30 දවසක් ඇතුළතදී 16 මාසයකට ඉල්ලූ ගණනෙන් ¾ පංගුවකට වටිනා ඇප ඒත්තුගත් මුද්‍ර ඔප්පුවලින් හෝ ¼ පංගුවකට වටිනා ඇප මුදලෙන් හෝ තිබා සම්පූර්ණ කරන්නට ඕනෑය.

ඇප පිණිස තිබනලද ඔප්පු සෝදිසිකිරීම සඳහා කොමිටියේ පෙරකදෝරු උන්නාන්සේට ගෙවියයුතු ගාස්තුවද, ඇප ඔප්පු සෑදීමටද, ඒවා සෝදිසිකර සම්පූර්ණකිරීමටද, ඉඩම් තක්සේරු කිරීමට සහ ඇප ඔප්පු රීජිස්තර්කිරීමටද, වර් 1917ක්වූ 16වෙනි ආඥාපණත අත්දමට ඔප්පුවල අලවන්ට ඕනෑ මුද්‍ර ගාස්තුවද ඔහු විසින් ගෙවන්ට ඕනෑය.

ඇප වෙනුවෙන් තබනලද ඉඩම්වල ඔප්පු, ඒවා මීට ප්‍රථම ඇපේකට නොහොත් උකසකට යටත්නැති බවට ඉඩම් ලියාපදිංචිකරණ රීජිස්ත්‍රාර්තැනගෙන් සහතිකපත්‍රයක් ලබාගත යුතුයි. මේ සහතිකපත්‍රය ලබාගැනීමට ඕනෑකරණ වියදම ඇප තබන අය විසින් දැරිය යුතුයි.

මේ ගැන වැඩිදුර කාරණ පලාතේ සෙවත් ප්‍රොවින්ෂල් රෝඩ් කොමිටියේ ප්‍රධානතැනගෙන් ඉල්ලුම්කළවිට දැනගන්ට පුළුවන.

කළුතර දිස්ත්‍රික්කුවේ.

බදුරෙලිය තොටුපල් රේන්දය.

ජේ. ජී. ෆ්‍රේසර්,
ප්‍රොවින්ෂල් රෝඩ් කොමිටියේ ප්‍රධානතැන.

වර් 1918ක්වූ අගෝස්තු මස
1වෙනි දින කොළඹදීය.

මෙහි පහත සඳහන්වන ගාලු දිසාවේ දොඩන්ගොඩ තොටුපල් රේන්ද වර් 1919ක්වූ ජනවාරි මස 1වෙනි දින පටන් දෙසැම්බර් මස 31වෙනි දින දක්වා ආණ්ඩුවෙන් බදු ගැණීමට එවනලද මුද්‍රලත් ඉල්ලුම්පත්‍ර ගාල්ලේ රෝඩ් කොමිටියේ ප්‍රධානතුමා විසින් භාරගනු ලැබේ.

2. මතුකී මුද්‍රලත් ඉල්ලුම්පත්‍ර මතුපිට සෙවත් ඇන්විලොප් උඩ Tender for Dodangoda Toll Rents "දොඩන්ගොඩ තොටුපල් රේන්ද සඳහා ඉල්ලුම්පත්‍ර" යන වාසගම ඇතුව වර් 1918ක්වූ අගෝස්තු මස 31වෙනි සෙනසුරාදා පස්වරු 2ක වනතුරු ගාල්ලේ කච්චේරියේදී භාරගනු ලැබේ. එවිට ඒවායේ මුද්‍ර කඩාබලනවා ඇත. තවද ඉල්ලුම්පත්‍ර දී සිටින සැමදෙනාම ඉදිරිපිටට ඇවිත් නැතහොත් තමන් විසින් වෙන අයෙකුට නියි බලයක්දී ඔහු ඒවා හෝ ඒ දෙනලද ඉල්ලුම්පත්‍ර සැබෑවූ ඇත්තේ ඒවා බවට ප්‍රධානතුමාට ඒත්තුගන්වන්ට ඕනෑය.

සතුටුදායක ඉල්ලුම්පත්‍රයක් ලැබුනේ නැත්නම් යම් ඉල්ලුම්පත්‍රයක් හෝ සියලුම ඉල්ලුම්පත්‍ර නිෂ්ප්‍රභාකිරීමේ අයිතිවාසිකම් ප්‍රධානතුමාට තබාගන්නාලදී. තවද සෑහෙන ඉල්ලුම්පත්‍රයක් නොලද්දේනම් එදිනම ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට ප්‍රධානතුමාට පුළුවන්වේ.

3. ප්‍රධානතුමා විසින් උතුමාණන්වහන්සේ වෙත ඔප්පුකර සිටීමට තෝරාගන්නාලද ඉල්ලුම්පත්‍රය අයිතිකාරයා විසින් ඉල්ලාපු ගණනෙන් දහයෙන් කොටසකට වැටහෙන මුදල් ගණන සල්ලිවලින් වහාම ඇප තබන්ට ඕනෑවා පමණකුත් නොව එම ඉල්ලීම උතුමාණන්වහන්සේ විසින් භාරගන්නට යෙදුනිනම්, ඔහුගේ ඉල්ලීම උතුමාණන්වහන්සේ විසින් ඒත්තුගත් බව දැනුම්දුන් දින පටන් 30දවසකදී එම ඉල්ලූ ගණනෙන් දෙකෙන් පංගුවකට ඇප මුදලෙන් හෝ තිබා සම්පූර්ණකරන්ට ඕනෑය. තවද ඇප ඔප්පු සම්පූර්ණකරනතුරු මාසෙක බදු මුදල අත්පිට බඳින්ට ඕනෑය.

4. මුදලෙන් ඇප සම්පූර්ණකරනවානම් විකිණීම දවසේ ඇපේට තබන්ට යෙදුන දහයෙන් කොටසකට වැටහෙන මුදල අවුරුද්දේ අන්තිම භාරමාසෙට ගෙවියයුතු මුදලෙන් කොටසක් හැටියට භාරගනු ලැබේ. වටිනා ඇප ඒත්තුගත් මුද්‍ර ඔප්පුවලින් සම්පූර්ණකරනවානම් ඉහතකී දහයෙන් කොටසක් රේන්දේ මුදල් ප්‍රවේසමට ප්‍රධානතුමා තබාගන්නට යෙදෙනවා ඇත.

5. ඇප පිණිස තබනලද ඔප්පු සෝදිසිකිරීම සඳහා ආණ්ඩුවේ අද්වකාත් උන්නාන්සේට ගෙවියයුතු ගාස්තුවද, ඉඩම් තක්සේරුකෙරීමට සහ ඇප ඔප්පු රීජිස්තර්කිරීමට ගෙවිය යුතු ගාස්තුත් ඔහු විසින් ගෙවන්නට ඕනෑය.

6. ගැණුම්කාරයා විසින් රේන්දපලේ පාරේ දෙපැත්තේ යාර 100ක් දුර පෙනෙන රතු එලි දෙකක් තබන්ට ඕනෑය.

7. ඈප වෙනුවෙන් තිබනලද ඉඩම්වල ඔප්පු ඒවා මීට ප්‍රථම ඈපේකට නොහොත් උකසකට යටත්නැති බවට ඉඩම් ලියාපදිංචිකරණ රෙජිස්ත්‍රාර්තැනගෙන් සහතිකපත්‍රයක් ලබා ගත යුතුයි. මෙම සහතිකපත්‍රය ලබාගැණීමට ඕනෑකරණ වියදම ඈප තබන අය-විසින් දැරිය යුතුයි.

මේ ගැණ වැඩිදුර කාරණා ගාල්ලේ දිස්ත්‍රික්රෝඩ් කොමිටියේ ප්‍රධානතැනගෙන් ඉල්ලුම්කළවිට දැනගන්ට පුළුවන.

ආර්. බී. හැලිහ්ස්,
ගාළු පලාතේ රෝඩ් කොමිටියේ ප්‍රධානතැන.

වර්ෂ 1918ක්වූ අගෝස්තු මස 2වෙනි දින
ගාල්ලේ දිස්ත්‍රික් රෝඩ්කොමිටි කන්තෝරුවේදීය.

---

ආණ්ඩුවේ ඉඩම් මිලදී ගැණීමට හෝ බදුගැණීමට දෙන ඉල්ලුම්පත්‍ර සම්බන්ධ මැනීම ඌව පලාතේ මින් මත්තට මාරුවෙන් මාරුවට කරණවා ඇත.

2. පලාත බිම් ප්‍රමාණය නොහොත් කොටාශ තුනකට බෙදා තිබේ:—

පළමුවෙනි බිම් ප්‍රමාණය නොහොත් කොටාශය, බින්තැන්න සහ වියළුව කොටාශ, යටිකිඳ රිල්පොල සහ බෝගොඩ කෝරල සහ උඩුකිඳ දෙහිවිනිපලාත, ගම්පහ යටිපලාත උඩපලාත සහ මැදපලාත කෝරල.

දෙවෙනි බිම් ප්‍රමාණය නොහොත් කොටාශය, උඩුකිඳ දඹවිනිපලාත සහ මගපලාත කෝරල, යටිකිඳ කුඹල්වෙල කෝරල, වෙල්ලස්සේ මහවැදිරට කෝරලේ සහ බුත්තල සහ වැල්ලවාය කොටාශ.

තුන්වෙනි බිම්ප්‍රමාණය නොහොත් කොටාශය, වෙල්ලස්සේ වෑගම් සහ මැදගම්පත්තු, නිල්ගල නිකවැටිය සහ දඹගල්ල කෝරල සහ යටිකිඳ පට්ටිපොල කෝරලේ.

3. දෙවෙනි බිම් ප්‍රමාණය නොහොත් කොටාශය වර්ෂ 1918ක්වූ සැප්තැම්බර් මස 15වෙනි දිනදී වසනු ලැබේ. මේ දිනයට පසු මේ බිම්ප්‍රමාණය තුළ ඉල්ලුම්පත්‍රවල ඉඩම් මැනීමට සර්වෙයර් ජනරල් උන්නාන්සේට අරිනු නොලැබේ. එසේ වුවත් මේ දිනේදී වසහලද මේ කොටාශයට ඇතුළත්වූ ඉඩම් විකිණීමට හෝ බදුදීමට යම් බාධාවක් තිබේද නැද්ද දැන ගැනීම පිණිස ලියාපදිංචිකරන්ට දෙන ඉල්ලුම්පත්‍ර බාධා කරන්නේ නැත.

4. ඊලග වසන බිම් ප්‍රමාණය නම් නොම්බර 3ත සහ 1ක බිම් ප්‍රමාණ දෙකයි. මේ බිම් ප්‍රමාණ දෙක ඇතුළත ඉඩම් මිලේට ගන්ට එවන ඉල්ලුම්පත්‍ර පුළුවන් ඉක්මනින් මුන්වහන්සේට එවන්ට ඕනෑය.

5. නොම්බර 3ත සහ 1ක බිම් ප්‍රමාණ වසන දවස ප්‍රසිද්ධකරාවී. නොම්බර 2ක බිම් ප්‍රමාණේ වැඩ නිමවෙන දවස් වකවානුව කිවිවූව මේ දවසද වේ.

ඇෆ්. බාව්ලව්,
ඌව දිසාවේ ආණ්ඩුවේ ඒජන්ත වම්හ.

වර්ෂ 1918ක්වූ අගෝස්තු මස 2වෙනි
දින බදුළු කච්චේරියේදීය.

---

## අ න්‍ය දූ න් වී ම.

වර්ෂ 1907ත් නො. 1ක් ආඥාපණතේ 8වෙනි උපවගන්තිය යටතේ දැන්වීමයි.

වී. කනගරත්නම් මහත්මයා යටතේ වැඩ පුරුදුවෙන සුන්නාගම්, අලවෙට්ටි දකුණේ පදිංචි සැම්බර් කන්දසියා පිල්ලේ වන මම, යාපනේ දිස්ත්‍රික්කුවේ දෙමළ භාෂාවෙන් නොනාරිස් වැඩ බැලීමට මෙතැන්සිට තුන්මාසයක් ගියතැන රිජිස්ත්‍රාර් ජනරල් උන්නාන්සේගෙන් අවසර ලබාගැනීමට අදහස්කර තිබෙන බව මෙයින් දැනුම්දෙමි.

වර්ෂ 1918ක්වූ ජූලි මස 17වෙනි දින
දකුණු අලවෙට්ටි සුන්නාගම්හිදීය.

ඇස්. කන්දසියා පිල්ලේ.

H. C. COTTLE, GOVERNMENT PRINTER, COLOMBO, CEYLON.